සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

| | | |
|---|---|---|
| ක්‍රිස්තියානි ධර්මය I<br>கிறிஸ்தவம் I<br>Christianity I | 43 S I | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>Two hours |

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ පසු පිටේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**

**1.** හෙබ්‍රෙව් ශුද්ධ ලියැවිල්ල පලස්තීනයේ ජුදෙව්වන් අතර පැවතුන ද එහි සම්මත ග්‍රන්ථාවලිය තීරණය කළේ,
(1) ක්‍රි.පූ. 3 වන සියවසේ හිප්පෝ මන්ත්‍රණ සභාවේ දී ය.
(2) ක්‍රි.පූ. 397 දී ජම්නියාවේ පැවති සම්මන්ත්‍රණයේ දී ය.
(3) ක්‍රි.පූ. 150 දී ෆ්ලෝරන්ස් හි පැවති රබ්බිවරුන්ගේ සම්මන්ත්‍රණයේ දී ය.
(4) ක්‍රි.ව. 90 දී ජම්නියාවේ පැවති රබ්බිවරුන්ගේ සම්මන්ත්‍රණයේ දී ය.
(5) ක්‍රි.ව. 406 දී මධ්‍යධරණී මුහුද අසල පැවති සම්මන්ත්‍රණයේ දී ය.

**2.** ක්‍රිස්තුන් වහන්සේගේ දහම් සේවයේ එක් කේන්ද්‍රස්ථානයක් වන ගලීල මුහුද අවට නගර වනුයේ,
(1) කපර්නාවුම, බෙත්සයිදාව සහ තිබේරියස් ය.
(2) කපර්නාවුම, දමස්කය සහ බෙත්සයිදාව ය.
(3) කපර්නාවුම, මෙසපොතේමියාව සහ තිබේරියස් ය.
(4) දමස්කය, බෙත්සයිදාව සහ මෙසපොතේමියාව ය.
(5) බෙත්සයිදාව, දමස්කය සහ තිබේරියස් ය.

**3.** බටහිර (පිටස්තර) බලවේගයන්ට විරුද්ධව සටන් කරමින් ජුදා ජනතාව එක්සත් කර ඔවුන්ව ජාතියක් වශයෙන් ගොඩනැගීමේ වගකීම පැවරුණේ කාහට ද?
(1) ආදි පිතෘවරුන්ට
(2) දිවැසිවරුන්ට
(3) වීර නායකයින්ට
(4) පරිසිවරුන්ට හා විනයධරයින්ට
(5) උපස්ථායකයින්ට

**4.** වියදම් පියවා ගැනීම පිණිස අධික ලෙස බදු අය කළ රජතුමා කවුරුන් ද?
(1) සාවුල් (2) සලමොන් (3) ශෙදෙකියා (4) ජොෂියා (5) ජෙහොයාකීම්

**5.** උතුරු රාජධානියේ වන්දනා ස්ථාන වන බෙතෙල් හා දාන් සෑදීමේ පරමාර්ථය කුමක් ද?
(1) ජාතික හා ආගමික ප්‍රතිසංස්කරණ හඳුන්වාදීමට
(2) උතුරු රාජධානියේ හිස් වූ නගරවල විදේශවලින් ගෙන ආ සිරකරුවන් පදිංචි කරවීමට
(3) මුලු පලස්තීනය ම නැවත වරක් දාවිත්ගේ පාලනයට නතු කිරීමට
(4) ශෙදෙකියා රජු ඇතුලු ජුදා ජනතාව බැබිලෝනියාවට ගෙන යාම වැළැක්වීමට
(5) ජනයා ජෙරුසලම් දේව මන්දිරයට යාම වැළැක්වීමට

**6.** ඉපැරණි නෛතික හා ආගමික සංකලනයන්ගෙන් යුත් සම්ප්‍රදාය කුමක් ද?
(1) යාවේ (2) එලොහිම් (3) පූජක (4) ජුදා (5) හෙබ්‍රෙව්

**7.** ඒක දේව වාදය කරා ජනතාව යොමු කිරීමේ දී දිවැසිවරුන් අවධාරණය කළ ගිවිසුම වන්නේ,
(1) නෝවා සමග ගිවිසුමයි.
(2) ආබ්‍රහම් සමග ගිවිසුමයි.
(3) මෙසියානික ගිවිසුමයි.
(4) සීනයි ගිවිසුමයි.
(5) කල්වාරි ගිවිසුමයි.

[දෙවැනි පිටුව බලන්න.

8. පහත සඳහන් ලක්ෂණ සලකන්න.
A - දේව ආඥාව - "ආලෝකය වේවා"
B - දේව මැවිල්ල අගය කිරීම - "එය මනහර බව දුටු සේක"
C - ජීවත් විය යුතු ආකාරය - "මේ ගසින් පමණක් නොකෑ යුතු ය"
D - ඔහුට සහකාරියක් මවන ලදී - "ඇට ස්ත්‍රිය කියා කියනු ඇත"
E - මිනිසා මැවීම - "නාස් පුඩු තුළට ජීවන හුස්ම හෙළීම"
F - කාලය ගණන් කිරීම - "සවස ගත විය, උදය උදා විය"

ඉහත ලක්ෂණ අතුරෙන් පළමු මැවීමේ කතාවට අදාළ වනුයේ,
(1) A, B හා D පමණි. (2) A, B හා E පමණි. (3) A, B හා F පමණි.
(4) A, C හා E පමණි. (5) A, C හා F පමණි.

9. පුරුෂයා හා ස්ත්‍රිය අතර සබඳතාව දෙවිඳුන් අරමුණු කළ,
(1) පාලනයකි. (2) තිළිණයකි. (3) ප්‍රයත්නයකි. (4) සලකුණකි. (5) සහජීවනයකි.

10. දෙවියන් වහන්සේ වෙත හැරී එන පව්කාරයාට පවා දයාව කරුණාව දක්වන බව පැහැදිලි වන කතා පුවත වන්නේ,
(1) නෝවා හා ජල ගැල්ම කතා පුවතයි. (2) කායින් හා ආබෙල් කතා පුවතයි.
(3) සර්පයා හා ස්ත්‍රිය අතර කථා පුවතයි. (4) දෙවියන් වහන්සේ හා ආදි මව්පියන් අතර කතා පුවතයි.
(5) බාබෙල් කොත පිළිබඳ කතා පුවතයි.

11. දාවිත් රජ පෙළපත නැමැති වෘක්ෂයෙන් රාජ අංකුරයක් හට ගන්නේ යැයි පැවසූ දිවැසිවරයා කවුරුන් ද?
(1) සෙකරියා (2) හොසියා (3) ආමෝස් (4) යෙසායා (5) එසකියෙල්

12. යෙසායා දිවැසිවරයා යවනු ලැබුවේ කිනම් ස්වභාවයකින් යුත් ජනතාවක් වෙතට ද?
(1) දැඩි උනන්දුවක් ඇති, ආශාවෙන් සිටි ජනතාවක් වෙත
(2) කොතෙක් සවන් දුන්නත්, දැඩි උනන්දුවක් නැති ජනතාවක් වෙත
(3) දැඩි සිත් ඇති, තේරුම් නොගත් ජනතාවක් වෙත
(4) දැඩි සිත් ඇති, උනන්දුවක් දක්වන ලද ජනතාවක් වෙත
(5) තේරුම් නොගන්නා, දේව බලයෙන් සන්නද්ධ වූ ජනතාවක් වෙත

13. ප්‍රඥා සාහිත්‍යය ආරම්භ වූවා විය හැක්කේ,
(1) සලමොන් රජතුමාගෙනි. (2) රාජ සභාවෙනි.
(3) සාමාන්‍ය පවුල් පරිසරයෙනි. (4) ධර්ම දේශකයාගෙනි.
(5) හිතෝපදේශයෙනි.

14. සමිඳාණන් වහන්සේගේ සිංහාසනාරූඪ මංගල්‍යය පසුබිම් කොටගෙන ගීතාවලිය බිහි වූ බව ප්‍රකාශ කරන බයිබල් විශාරදයා කවුරුන් ද?
(1) හර්මන් ගුන්කල් (2) ආතර් වයිසර් (3) රේමන් බ්‍රවුන්
(4) විලියම් බාක්ලේ (5) සිග්මන් මොවින්කල්

15. ගීතාවලියෙහි, කරදර හා ආපදා අවස්ථාවල සහාය පතා දෙවියන් වහන්සේට ආයාචනා කරනු ලබන ගීත හඳුන්වනු ලබන්නේ,
(1) විලාප ගීත ලෙස ය. (2) රාජකීය ගීත ලෙස ය. (3) ප්‍රඥා ගීත ලෙස ය.
(4) තුති දීමේ ගීත ලෙස ය. (5) විශ්වාසයේ ගීත ලෙස ය.

16. එකම දේශයක් වූ ජුදයාව, සමාරිය හා ඉදුමය පාලනය කරනු සඳහා තිබේරියස් අධිරාජ්‍යයා විසින් පත් කරන ලද ආණ්ඩුකාරවරයා කවුරුන් ද?
(1) හෙරෝද් ඇන්ටිපස් (2) පොන්තියුස් පිලාත් (3) සෙරුබ්බාබෙල්
(4) හෙරෝද් අග්‍රිපා (5) අන්තියුස් රූපස්

17. ජේසුස් වහන්සේගේ කාලයේ පලස්තීනයේ පාලන බලය හිමි වූයේ,
(1) පිලිස්තිවරුන්ට ය. (2) ග්‍රීකවරුන්ට ය. (3) ලෙවීවරුන්ට ය.
(4) එසේනිවරුන්ට ය. (5) රෝමවරුන්ට ය.

18. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ, ජුදා ජනතාව අපේක්ෂාවෙන් සිටි මෙසියස් වහන්සේ බව අවධාරණය කළේ කවුරුන් ද?
(1) ශුද්ධ වූ ලූක්තුමා (2) ශුද්ධ වූ මාක්තුමා
(3) ශුද්ධ වූ මතෙව්තුමා (4) ශුද්ධ වූ ජොහන්තුමා
(5) ශුද්ධ වූ බාර්ණබස්තුමා

[තුන්වැනි පිටුව බලන්න.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

19. පහත සඳහන් වරප්‍රසාද සලකන්න.

A - නෛතික සාධාරණත්වය ලැබීම
B - ප්‍රසිද්ධියේ යාච්ඤා කිරීමේ නිදහස
C - දේශපාලන අයිතිවාසිකම් සඳහා හිමිකම් කීම
D - ජෙරුසලම් මන්ත්‍රණ සභාවට සහභාගි වීම
E - අර්ථික වාසි ලබා ගැනීම
F - සිරගත වීමෙන් වැළකී සිටීම

ඉහත වරප්‍රසාද අතුරෙන් රෝම පුරවැසිභාවයට හිමිකම් කියනු ලබන පුද්ගලයන් සඳහා හිමිවන වරප්‍රසාද වන්නේ,

(1) A, B හා C පමණි.
(2) A, B හා E පමණි.
(3) A, C හා E පමණි.
(4) A, C හා F පමණි.
(5) C, D හා E පමණි.

20. රෝමයේ සිරගතව සිටිය දී ශුද්ධ වූ පාවුලුතුමා විසින් ම ලියන ලද හසුනක් වනුයේ,

(1) කොලොස්සි පළමු හසුනයි.
(2) එපීස හසුනයි.
(3) කොරින්ති දෙවන හසුනයි.
(4) ගලාති හසුනයි.
(5) පිලිප්පි හසුනයි.

21. කන්ද උඩ දේශනාව මගින් පැහැදිලි කරනුයේ,

(1) ලෞකික ලෝකයේ හැකියාවන්ගෙන් පූර්ණ වීම ය.
(2) ගුණ ගරුක යහපත් දිවි පෙවෙතක ගුණාංග ය.
(3) ප්‍රතිලාභ නොතකා යහපත කිරීම පිළිබඳව ය.
(4) අල්පේච්ඡ ජීවිතයක් හා සරල පැවැත්මක් පිළිබඳව ය.
(5) ඉවසීමෙන් දූත කාර්යයේ යෙදී සිටිය යුතු බව ය.

22. ශුද්ධ වූ මතෙව්තුමා තම ශුභාරංචියේ ක්‍රිස්තුන් වහන්සේගේ පෙළපත දැක්වීම මගින් උන් වහන්සේ ආබ්‍රහම්ගේ හා කවරකුගේ පුත්‍රයා ලෙස ඉදිරිපත් කරන්නේ ද?

(1) ආදම්
(2) දාවිත්
(3) ජාකොබ්
(4) ඊසාක්
(5) ජෝශප්

23. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ඉගැන්වීම්වලට අනුව, උපමාවක් වනුයේ,

(1) සත්‍ය නොවන මනඃකල්පිත වූ සිද්ධියකි.
(2) ස්වභාව ධර්මයේ සිදුවන වෙනස්කම්වලට අදාළ කතාවකි.
(3) සරල පණිවිඩයක් ගැඹුරු දේව ධාර්මිකත්වයකින් ඉගැන්වීමකි.
(4) ජන ජීවිතයට ඉතා සමීප සිද්ධි ඇතුළත් කුඩා කතාන්දරයකි.
(5) සවන් දෙන්නන්ගේ අවධානය දිනා ගැනීමට යොදා ගන්නා කථාන්දරයකි.

24. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ප්‍රාතිහාර්ය කළේ සතර ආකාර වහල්කම්වලින් පීඩාවට පත් ජනතාව ගලවා ගැනීමට ය. ඒවා අතුරෙන් වහල්කම් දෙකක් වනුයේ,

(1) මරණය සහ සතුරාගෙන් පලි ගැනීමයි.
(2) ලෙඩ රෝග සහ ස්වභාවික බලවේගයි.
(3) දුෂ්ටාත්මයන්ට නතුවීම හා ආශාවන්ට වහල්වීමයි.
(4) ලෙඩ රෝගවලට හා සුරාසූදුවට ගොදුරු වීමයි.
(5) විවිධ ඇබ්බැහි වීම සහ ස්වභාවික බලවේගයි.

25. කොරින්ති පළමු හසුනට අනුව ශරීර දවන යාගයක් ලෙස පූජා කිරීමටත් වඩා උතුම් වන්නේ,

(1) පරිත්‍යාගයයි.
(2) කැපවීමයි.
(3) ප්‍රේමයයි.
(4) එකමුතුකමයි.
(5) සහයෝගීතාවය යි.

26. ඉශ්රායෙල් රජවරු බලය, කීර්තිය හා ධනය මත සිය රජකම ගොඩනැගුව ද ක්‍රිස්තුන් වහන්සේ තම රාජ්‍ය ගොඩනැගුවේ,

(1) උත්තම පූජකයකු වීමෙනි.
(2) සේවක රජකු වීමෙනි.
(3) බැටළු එඬේරකු වීමෙනි.
(4) අසහාය මැදිහත්කරුවකු වීමෙනි.
(5) සැබෑ දිවැසිවරයකු වීමෙනි.

27. ශුද්ධ වූ ජොහන් ශුභාරංචියට අනුව දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ස්ථාපිත කිරීම සම්බන්ධව පූර්ව සලකුණක් ලෙස ඉදිරිපත් කරන ලද ප්‍රාතිහාර්ය කුමක් ද?
(1) ලාසරස් මරණයෙන් නැගිටුවීම (2) මසුන් රාශියක් හසුකර ගැනීම
(3) පූප වැඩි කිරීම (4) ජලය මිදි යුසට හැරවීම
(5) අන්ධ බර්තලමෙයුස් සුව කිරීම

28. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ස්ථාපිත කිරීමේ සිද්ධිය වාර්තා කිරීමේ දී ශුද්ධ වූ ලූක්තුමා සහ ශුද්ධ වූ පාවුලුතුමා එක සම්ප්‍රදායක් ද ශුද්ධ වූ මාක්තුමා සහ ශුද්ධ වූ මතෙව්තුමා තවත් සම්ප්‍රදායක් ද අනුගමනය කර ඇත. එම සම්ප්‍රදායන් වන්නේ,
(1) ජෙරුසලෙම් සම්ප්‍රදාය හා ජුදා සම්ප්‍රදායයි.
(2) ජෙරුසලෙම් සම්ප්‍රදාය හා යාවේ සම්ප්‍රදායයි.
(3) අන්තියෝකියානු සම්ප්‍රදාය හා පූජක සම්ප්‍රදායයි.
(4) අන්තියෝකියානු සම්ප්‍රදාය හා ජෙරුසලෙම් සම්ප්‍රදායයි.
(5) අන්තියෝකියානු සම්ප්‍රදාය හා ද්විතීය සම්ප්‍රදායයි.

29. තේවාචාරීවරුන් අතුරෙන් සැමවිට ම ව්‍යවස්ථාව ගෙන හැර දක්වමින් කථා කළේ,
(1) පිලිප් තුමා ය. (2) නිකනෝර් තුමා ය.
(3) ප්‍රොකොරස් තුමා ය. (4) තිමොන් තුමා ය.
(5) ස්තේපන් තුමා ය.

30. කිතුනුවන්ට එරෙහිව පීඩාවක් ඇරඹූ ප්‍රථම අධිරාජ්‍යයා හා පළමුවරට අධිරාජ්‍යය පුරා ම පීඩනය පැතිරයාමට සැලැස්සූ අධිරාජ්‍යයා,
(1) මැක්සිමිනස් හා මාකස් අවුරේලියස් වේ.
(2) සෙප්ටිමස් හා ඩෙසියස් වේ.
(3) නීරෝ හා ඩෙසියස් වේ.
(4) වැලේරියන් හා ඩොමීෂියන් වේ.
(5) නීරෝ හා ඩොමීෂියන් වේ.

31. වැලේරියන් අධිරාජ්‍ය සමයේ හි දිවි පිදූ ප්‍රාණ පරිත්‍යාගීවරුන් වන්නේ,
(1) ශුද්ධ වූ සෙබස්තියන්තුමා හා ශුද්ධ වූ ඇග්නස්තුමියයි.
(2) ශුද්ධ වූ ප්ලේවියන්තුමා හා ශුද්ධ වූ අගතාතුමියයි.
(3) ශුද්ධ වූ ඇලෙක්සැන්ඩර්තුමා හා ශුද්ධ වූ ෆිලික්ස් පාප්තුමායි.
(4) ශුද්ධ වූ සිසිලියාතුමිය හා ශුද්ධ වූ ජස්ටින් තුමායි.
(5) ශුද්ධ වූ ලෝරන්ස්තුමා හා ශුද්ධ වූ II සික්ස්ටස් පාප්තුමායි.

32. ක්‍රි.ව. 431 දී පැවති එපීස මන්ත්‍රණ සභාවේ ශ්‍රේෂ්ඨ ධර්මාචාර්යවරයා ලෙස කටයුතු කළ ශුද්ධෝත්තම පියතුමා වූයේ,
(1) I සෙලස්තියන් ශුද්ධෝත්තම පියතුමා ය.
(2) XIII ලියෝ ශුද්ධෝත්තම පියතුමා ය.
(3) ශුද්ධ වූ II සික්ස්ටස් ශුද්ධෝත්තම පියතුමා ය.
(4) ශුද්ධ වූ X පියුස් ශුද්ධෝත්තම පියතුමා ය.
(5) XXIII ජුවාම් ශුද්ධෝත්තම පියතුමා ය.

33. ඇලෙක්සැන්ඩ්‍රියානු ගුරුකුලයේ ප්‍රධානියා වශයෙන් ඉතිහාසය විසින් නම් කරනු ලබන්නේ කවුරුන් ද?
(1) ශුද්ධ වූ සිරිල්තුමා (2) ශුද්ධ වූ ඔරිජන්තුමා
(3) ශුද්ධ වූ ජස්ටින්තුමා (4) ශුද්ධ වූ ටර්ටුලියන්තුමා
(5) ශුද්ධ වූ අගුස්තීනුතුමා

34. ටර්ටුලියන් සභා පියතුමා ලියූ කෘතීන් අතර ප්‍රධාන තැනක් ගන්නේ කුමන ග්‍රන්ථය ද?
(1) හෙක්සප්ලා (2) වේද භේද විවේචනය (3) පාපොච්චාරණය
(4) දේව නගරය (5) සාධාරණ යුද්ධය

35. පෙලාජියස්ගේ මතයට විරුද්ධව අදහස් දැක්වූ සභා පියතුමා කවුරුන් ද?
(1) ශුද්ධ වූ සිරිල්තුමා (2) ශුද්ධ වූ බැසිල්තුමා
(3) ශුද්ධ වූ ග්‍රෙගරිතුමා (4) ශුද්ධ වූ අගුස්තීනුතුමා
(5) ශුද්ධ වූ අතනාසියුස්තුමා

[පස්වැනි පිටුව බලන්න.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki



36. ගෝත්‍රික ආක්‍රමණ යුගය, යුරෝපීය ඉතිහාසයේ දැක්වෙන්නේ කිනම යුගයක් ලෙස ද?
(1) වර්ධන යුගය
(2) මුල් යුගය
(3) ස්වර්ණමය යුගය
(4) දීප්තිමත් යුගය
(5) අඳුරු යුගය

37. සෑම ආසන දෙව්මැඳුරකට ම යාබදව පාසලක් ආරම්භ කරන ලෙස සෑම රදගුරුතුමකුට ම අණ කළේ,
(1) මහා චාල්ස් රජතුමායි.
(2) VIII හෙන්ද්‍රි රජතුමායි.
(3) ෆ්‍රැන්ක් රජතුමායි.
(4) I ඔට්ටෝ රජතුමායි.
(5) මහා හෙරෝද් රජතුමායි.

38. 'සුම්මා තියොලොජිකා', නැමැති විශිෂ්ටතම කෘතිය රචනා කරන ලද්දේ,
(1) ශුද්ධ වූ අගුස්තීනුතුමා විසිනි.
(2) ශුද්ධ වූ අතනාසියුස්තුමා විසිනි.
(3) ශුද්ධ වූ දොමිනික්තුමා විසිනි.
(4) ශුද්ධ වූ තෝමස් ඇක්වයිනාස්තුමා විසිනි.
(5) ශුද්ධ වූ කුරුසියේ ජුවාම්තුමා විසිනි.

39. ස්විස්ටර්ලන්තයේ රෙපරමාදු ප්‍රගමනයේ පුරෝගාමියා ලෙස මහත් පරිශ්‍රමයකින් ක්‍රියා කළේ,
(1) විලියම් බූත්තුමා ය.
(2) ජෝන් කැල්වින්තුමා ය.
(3) උල්රිච් ස්වින්ග්ලිතුමා ය.
(4) ජෝන් වෙස්ලිතුමා ය.
(5) මාටින් ලූතර්තුමා ය.

40. ගැලවීම ඇදහිල්ලෙන් ලැබෙන බවත්, එය කිතුනු ජීවිතයේ මූලික ධර්මතාවක් බවත් පෙන්වා දුන්නේ,
(1) ජෝන් වෙස්ලිතුමා හා චාල්ස් වෙස්ලිතුමා ය.
(2) උල්රිච් ස්වින්ග්ලිතුමා හා ජෝන් කැල්වින්තුමා ය.
(3) විලියම් බූත්තුමා හා තෝමස් මූවර්තුමා ය.
(4) ජෝන් වෙස්ලිතුමා හා ජෝන් කැල්වින්තුමා ය.
(5) ජෝන් ෆිෂර්තුමා හා චාල්ස් වෙස්ලිතුමා ය.

41. විවිධ නිකායන් විසින් සිදු කළ සේවා කිහිපයක් පහත දැක්වේ.
A - පැවිදි නිකායන් සංවිධානය කර ආදර්ශමත් පූජකවරුන් බිහි කිරීම
B - ගීත ප්‍රබන්ධ කරමින් එළිමහන් දේශන පැවැත්වීම
C - තම ධර්මෝපදේශ සේවයත්, ආශ්‍රමික ජීවිතයත් එකට එක්කර දිවි ගෙවීම
D - ලෙඩුන්ට උපස්ථාන කරමින් හා ඉතා දුෂ්කර ලෙස වැඩ කිරීමෙන් ලබා ගත් ආදායමෙන් ජීවත් වීම
E - ත්‍රිදෙන්ත්‍රිනු මන්ත්‍රණ සභාවේ ඉගැන්වීම් අනුව පූජකවරුන් බිහි කිරීමේ වගකීම පැවිදි නිකායන්ට ලබා දීම

ඉහත සේවා අතුරෙන් ශුද්ධ වූ සභාව තුළ ප්‍රතිසංස්කරණ ඇති කිරීමට වින්සෙන්තියානු නිකාය අනුගමනය කළ සේවා දෙකක් වූයේ,
(1) A හා B පමණි.
(2) A හා C පමණි.
(3) A හා E පමණි.
(4) B හා C පමණි.
(5) C හා E පමණි.

42. ප්‍රංශයට හා යුරෝපයට අවශ්‍ය වූ ආගමික ස්ථාවරත්වයක් ලබාදීම සඳහා නැපෝලියන් අධිරාජ්‍යයා සුහද ගිවිසුමකට එළඹියේ කුමන ශුද්ධෝත්තම පියතුමා සමග ද?
(1) අති උතුම් VII පියුස් ශුද්ධෝත්තම පියතුමා
(2) අති උතුම් XXIII ජුවාම් ශුද්ධෝත්තම පියතුමා
(3) අති උතුම් XI පියුස් ශුද්ධෝත්තම පියතුමා
(4) අති උතුම් XIII ලියෝ ශුද්ධෝත්තම පියතුමා
(5) අති උතුම් X පියුස් ශුද්ධෝත්තම පියතුමා

43. ක්‍රි.ව. 1605 දී 'ජපමාල දේව මාතාවන්' නමින් දෙව්මැදුරක් ඉදිකරන ලද්දේ කුමන නිකායක පියතුමන් ලා විසින් ද?
(1) ජේසු නිකායික
(2) බෙනදික්තන නිකායික
(3) අගුස්තීනු නිකායික
(4) ෆ්‍රැන්සිස්කාන නිකායික
(5) දොමිනිකාන නිකායික

44. පළමු වන රාජසිංහ රජතුමා මහනුවර ආක්‍රමණය කළ විට පෘතුගීසීන්ගේ ආරක්ෂාව පතා ත්‍රිකුණාමලයට පලා ගිය රජ පවුලේ පුත්‍රයකු වන්නේ,
(1) කරලියද්දේ බණ්ඩාරයි.
(2) ජයවීර බණ්ඩාරයි.
(3) ධර්මපාල කුමරුයි.
(4) වීරසුන්දර බණ්ඩාරයි.
(5) දොන් ජුවාම් යමසිංහයි.

**45.** ශ්‍රී ලංකාව යටත් විජිතයක්ව පැවති සමයේ දක්නට ලැබුණු හිතකර ලක්ෂණ කිහිපයක් පහතින් දැක්වේ.

A - වෙළඳ කටයුතු සඳහා මංමාවත් සැදීම
B - බටහිර වෛද්‍ය ක්‍රමය ආරම්භ කිරීම
C - ශුද්ධ බයිබලය සිංහල භාෂාවට පරිවර්තනය කිරීම
D - විවාහයේ ස්ථාවරත්වය තහවුරු කිරීම
E - උපකෘත පාසල් ක්‍රමය ක්‍රියාත්මක කිරීම
F - මැග්නා කාටර් පනත ක්‍රියාත්මක කිරීම

ඉහත සඳහන් ලක්ෂණ අතුරෙන් ලන්දේසි පාලන සමයේ දක්නට ලැබුණු හිතකර ලක්ෂණ වන්නේ,

(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) A හා E පමණි.
(4) B හා C පමණි. (5) D හා F පමණි.

**46.** කොළඹ, යාපනය සහ මහනුවර යන අපෝස්තලික අනුපදවි තුන රදගුරු පදවි තත්ත්වයට උසස් කරනු ලැබුවේ කවුරුන් විසින් ද?

(1) අති උතුම් XIII ලියෝ ශුද්ධෝත්තම පියතුමා
(2) අති උතුම් XVI ග්‍රෙගරි ශුද්ධෝත්තම පියතුමා
(3) අති උතුම් IX පියුස් ශුද්ධෝත්තම පියතුමා
(4) අති උතුම් ජෝන් ස්ට්වන් සෙමෙරියා හිමිපාණන්
(5) අති උතුම් තෝමස් බෙන්ජමින් කුරේ කාදිනල් හිමිපාණන්

**47.** බ්‍රිතාන්‍ය රජයට විරෝධය පළ කරමින් පවත්වන ලද ප්‍රසිද්ධ රැස්වීමක මුලසුන දැරූ කතෝලික පුද්ගලයා වූයේ,

(1) ශ්‍රීමත් ජේම්ස් පීරිස් මහතා ය.
(2) ජේ. ඒ. එල්. කුරේ මහතා ය.
(3) ඊ. ඩබ්ලිව්. පෙරේරා මහතා ය.
(4) ඇල්බට් ඒ. වික්‍රමසිංහ මහතා ය.
(5) ඩී. ආර්. විජේවර්ධන මහතා ය.

**48.** දරුවන් කෝප නොකිරීමටත්, සැම විට ම ආදරයෙන්, කරුණාවෙන් හා ක්‍රිස්තියානි ලීලාවෙන් ගොඩ නැගිය යුතු බවටත්, දෙමාපියන්ට උපදෙස් දෙන ආකාරයෙන් ශුද්ධ වූ පාවුලුතුමා විසින් ලියන ලද හසුන කුමක් ද?

(1) රෝම හසුන
(2) තිමති හසුන
(3) ගලාති හසුන
(4) එපීස හසුන
(5) පිලිප්පි හසුන

**49.** පරිසරයට ආදරය කළ ජේසුස් වහන්සේ සිය ඉගැන්වීම්වල දී එය උපයෝගී කර ගැනීමෙන් තහවුරු වනුයේ,

(1) එහි විනාශය වටහාගත් බවයි.
(2) එහි නිෂ්ඵලත්වය වටහාගත් බවයි.
(3) එහි දූෂණය වටහාගත් බවයි.
(4) එහි අගය වටහාගත් බවයි.
(5) එහි තාවකාලිකත්වය වටහාගත් බවයි.

**50.** කිතුනු සභා තුළ ඇති සාධනීය යහපත් ලක්ෂණ පෙන්වා දෙමින් කිතුනු සභා සමගිය එක සිතින් ප්‍රාර්ථනා කරන ව්‍යවස්ථාව වන්නේ,

(1) පෙරදිග කතෝලික සභා පිළිබඳ ප්‍රකාශනයයි.
(2) වර්තමාන ලෝකයේ ශුද්ධ වූ සභාව නැමැති ව්‍යවස්ථාවයි.
(3) ආගමික නිදහස පිළිබඳ ප්‍රකාශනයයි.
(4) ලෝක සාමය පිළිබඳ විශ්ව ලේඛනයයි.
(5) ජාතීන්ගේ ආලෝකය විශ්ව ලේඛනයයි.

* * *

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න